සටහන් තබන්නේ
**ප්‍රභාත් රාජසූරිය**



සීතල දුරුත්තට ඇරයුම් කරමින් අසිරිමත් නත්තල සමුගනිමින් තිබේ මෙසමයෙහි ගී රස ලෝලීන් සවනත නිරතුරු දෝංකාර නංවන්නේ නත්තල් බැති ගීතිකාවන්ය

මුළු ලොවම සමරණ ජේසු උපත සිහිගන්වන එවැනි ගීතික ඒ නිසාම අපමණය බහුලය එය එසේ වුවද පසුගිය සියවසේ මැද භාගය පමණ වන තෙක්ම ලක්වැසි සිහල කතෝලික දනන් හට සමිප ස්වභාෂිත නත්තල් බැති ගී බිහිව තිබුනේ ඉතා සීමිතවය

සියවස් තුනකට ඔබ්බෙන් උඩරට රාජධානිය පැවති සමයේ ලන්දේසින්ගේ රෙපෙරමාදු ක්‍රිස්තියානිය නිසා මෙහි පිරිහෙමින් පැවති කතෝලික දහම යළි නගා සිටුවන්නට පෙ-

මිතුරෝ ලා සිලෝනියන්ස්

කළුතර රේමන්ඩ් ෆොන්සේකා ඇතුළු පාසල් මිතුරෝ සමණළයෝ

රත්නපුරයේ ක්ලැරන්ස් විජේවර්ධන ඇතුළු මිතුරු කැළ මුන්ස්ටෝන්ස්

හා

මේ නිර්මාණයට දායක වූ කොටහේනේ මෙල්රෝයි ධර්මරත්න ඇතුළු සහෝදර කැල ධර්මරත්න බ්‍රදර්ස්

හා තවත් කන්ඩායම් 50 ට අධික සංඛාවක් උපත ලැබීය

ඔවුහු බොහෝ අවස්ථාවන්හිදී තම තමන්ම පද රචනා කරන ලද ගී තමන්ම තනු නිර්මාණය කර තමන්ගේම සරළ සංගීත භාන්ඩ යොදා ගනිමින් ගැයුහ වැයුහ බටහිර

# ශිරෝමි ප්‍රනාන්දු
## කිතුණු ළමා බැති ගී ආලෙලුවියා..

රමුණ ගත්තේ දක්ෂින භාරතයෙන් මෙහි සැපත් වූ ජාකොබේ ගොන්සාල්වේස් පියනම ය

එතුමාණන් ගේ අප්‍රතිහත ධෛර්යය නිසාත් සිංහල භාෂාවෙන් කතෝලික දහම ප්‍රචාරය කිරීමේ පුරෝගාමී මෙහෙවර නිසාත් ස්ව-දේශීය සිංහල බැති ගී සරණියක් උපත ලැබිය

එතුමා විසින් විරචිත ඇතැම් ගී දශක කිහිපයකට පෙර ගුවන් විදුලි පටිගතකිරීම් උදෙසා ප්‍රවිණ ශිල්පී අයිවෝ ඩෙනිස් විසින් යළි ප්‍රතිනිර්මාණය කරනු ලැබිය
ඉන් අනතුරුව ඒ සඳහා ක්‍රියාශීලිව පෙරමුණ ගත්තේ පන්සලේ පියතුමා නමින් බොදුණු ගී රසිකයන්ගේ පවා සිත් ඇඳබැඳ ගත් මර්සලිනු ජයකොඩි පියතුමාණෝය

එතුමෝ ජනප්‍රිය බටහිර කිතු බැති ගී නාදමාලාවට සරිලන සේ සිංහල බැති ගී රචනා කරනු ලැබූහ

රෑ තරු බබලනවා.........
(චිත්‍රා සෝමපාල පසුව ලතා වල්පොළ)

රොනට වඩින බිගු ඔබයි..........(චිත්‍රා)

මේ කටයුත්ත සිදුකරනු ලැබුවේ 50 දශකයේදීය ඉන් ඉක්බිති ලාංකීය ගී වංශ කථාවේ නව පරිච්ඡේදයක් අරඹමින් සිංහල බටහිර වේග රිද්ම ගී කලාවේ උපත සිදුවුයේ 60 දශකයේදීය ඒ සඳහා පෙරමුණ ගත්තේ මුල්වුයේ ද සිය ළඳරු වියේ සිට උරුමයෙන් ගී රස පහස ඇසුර නිති ලැබූ බටහිර වෙරළ තීරය ඇසුරු කල යව්වන කතෝලික බැතිමතුන්ය

ඒ අනුව

මීගමුවේ නෙවිල් ප්‍රනාන්දු ඇතුළු කණ්ඩායම ලොස් කැබැයියරෝස්
මිගමුවේ මෙරිල් ප්‍රනාන්දු ඇතුළු පිරිස ඇමිගෝ රොමැන්ටිකාස්
මිගමුවේ ජෝ බි පෙරේරා අතුළු පිරිස ලොස් මුචාචෝඕස්
මොරටුවේ මනිලා ප්‍රනාන්දු ඇතුළු පවුලේ සැම වින්ස්ලෝ සිකස්
මොරටුවේ ජෙරී ජයසේකර ඇතුළු පිරිස මී බ්‍රදර්ස්
කෝට්ටේ නොයෙල් බ්‍රයන් රණසිංහ ඇතුළු

ගී ආර ට අනුගත වන ලෙසින් ඒවා ස්පාඤ්ඤ ගිටාර් මධ්‍යම ඇමෙරිකානු ගෝත්‍රික වාද්‍ය උපකරණයක් වූ බොංගෝස් ලතින් ඇමෙරිකානු ගයිරෝ මරකස් වැනි වාද්‍ය භාන්ඩයන් ඒ සඳහා භාවිත කෙරිනි බටහිර වෙරළ තීරයේ සංචාරක නිවාඩු නිකේතන හා හෝටල් හි අදද ඇසෙන්නේ මේ ආරේ ගායනයන්ය

පසුව ඒව ක්‍රමයෙන් ජනප්‍රිය වු අතර ඔවුන් සාමාන්‍ය ශ්‍රාවක ජනයා වෙත කැන්දා ආ පාළම වුයේ 65-70 ගුවන් විදුලියයි ඔවුන් වෙත වාසනාව ලඟාකරදුන්නේ එවකට එහි මහ පුටුව හෙබවූ ප්‍රවිණ පරිපාලක නෙවිල් ජයවීරයන්ගේ සෘජු සංගීත ප්‍රතිපත්තියයි හින්දුස්ථානි සංගීතය අරක්ගත් ගුවන් විදුලියේ බහුතර සංගීත ශිල්පීන් ගේ විරෝධය නොතකා ඒවා තැටි වලට නංවනු ලැබීය

එතැන් සිට පෞද්ගලික තැටි ව්‍යාපාරිකයන් විසින් ලැබූ ඇරයුම් නිසා ඔවුන් හට ඉහත කී සම්ප්‍රදායික ලතින් ඇමෙරිකානු සංගීත භාන්ඩ වලට අමතරව වෘත්තිය වාදන ශිල්පින්ගේ සේවය ලබා ගන්නට සිදුවිය ඒ වෙළඳතැටි ගීතයන්හි ශ්‍රවණ මාධූර්යය හා ප්‍රමිතිය රකින්නටය

70 දශකය එළැඹ තිබුණි

ගසට පොත්ත මෙන් බෞද්ධයන් ගේ වෙසග හා එක්ව බැඳුනේ බෙග් මාස්ටර් ගේ ඔබේරාගී මණ කැළඹේදෝ (බුද්ධං සරණං ගච්ඡාමි - අංගුලිමාල හින්දි - සිංහල හඬකැවූ සිනමාපටය වෙනුවෙන් 1962 කරුණාරත්න අබේසේකර) යම්සේද ඊටත් වඩා හෙළ කිතුණුවන්ගේ නත්තල හා බැඳුනු ගීතයේ උපත සිදුවුයේ අසාමන්‍ය අපූර්ව කුසලාතවක් නිධනාගත වූ ක්ලැරන්ස් විජේවර්ධන කිතු බැතිමන් ගායකයා පද රචකයා තනු නිර්මාපකයා - සංගීත සංයෝජකයා නිසයි

මුන්ස්ටෝන්ස් ගායක කන්ඩායමෙන් ඉවත් වී සුපර් ගෝල්ඩන් චයිම්ස් නමින් 1972 වසරේදි පමණ ඔහු පිහිටුවාගත් කන්ඩායමේ අනිල් භාරති ශිල්පියා ගේ හඬදායකත්වයෙන් උපන් ඒ ගීතය ගී රසිකයන්ට හඳුන්වාදෙන්නට අවශ්‍ය නැත

බෙත්ලෙහෙම් පුරේ - දිළිඳු ගව ලෙනේ ........
ඔරුව තුලේ සිසිලේ නිදයි - ජේසු බිළින්දා ...
පද සංකල්පනය නැසිගිය කරුණාරත්න අබේසේකර
සංගීතය * නැසිගිය ක්ලැරන්ස් විජේවර්ධන

මේ අනුව දිවයිනේ වාඩාත්ම වැදගත් අගමික උත්සව ද්විත්වයේ වඩාත්ම වැදගත් ගී නිර්මාණයන්හි හිමිකරුවා විමේ දුර්ලභ වාසනාව අබේසේකරයන් සතුය

## හෙළ කිතුණු ළමා ළපැටියන් වෙනුවෙන් බැති ගීයක් ?

කිතු උපත ප්‍රස්තුත කරගනිමින් වු එවන් නිර්මාණයක තතු විස්තර අප්‍රකටය නමුත් 50 දශකයේ දී ජේසු බිළිඳා හැරුණුවිට නත්තලේ මහා සංකේතය වූ ශාන්ත නිකලස් පියතුමා සිහිගන්වන නත්තල් සීයා වෙනුවෙන් එවන් ගීතයක් ගුවන් විදුලියේ පටිගත කෙරී තිබිණි ඒ එවක ගුවන් විදුලි ගායකයෙකු වු ආර් එස් මෙන්ඩිස් විසිනි එවක ගුවන් විදුලියේ සේවය කළ පසුව සිනමා නළුවෙකු ලෙස අභිෂේක ලැබූ නැසිගිය උපාලි අත්තනායක ශිල්පියා ගේ කවි සිතිවිල්ලක් වූ එහි තනු නිර්මාණය නැසිගිය පැට්‍රික් දෙණිපිටිය සංගීතඥයා විසින් සිදුකරනු ලැබිය

පුළුන් වගේ සුදු රැවුල දිගයි - ලස්සන ඇඳුම හැඩයි කදිමයිඩ...........
රබන් ගසයි ගෙජ්ජිද සොලවයි - මේ එන්නේ නත්තල් සීයයි........

ඉන් මෙපිට 70 දශකයේදී බෙත්ලෙහෙම් පුරේ ගීතය උපන් අවධියේ උක්ත මාතෘකාගත ගී නිර්මාණයක් සඳහා පෙරමුණ ගත්තේද ඉහත කී කන්ඩායම් ගී සාමාජික කැළක මෙ-හෙයුම්කරු මෙල්රෝයි ධර්මරත්නයන් විසිනි

දරුවන්ට ගැළපෙන අපූර්ව පද සංකල්පනා ගෙතිමේ ශූරයෙකු වු ඔහු ගේ එකි ප්‍රතිභාව මෙහි ද මනාව ප්‍රකට කෙරෙයි

උඳුවප් මාසේ - සිතල දවසක පුංචි පහේ ගවමඩුවක ඉපදුනි
පුංචි බබා - ජේසු බබා .........
ලස්සන අහසේ *තරුවක් දිළිසේ - ඉපදුනු ආරංචිය පැතිරෙව්වේ

පුංචි බබා - ජේසු බබා .........................

ගීතය තනුව නිර්මාණය කරමින් එවකට ජනප්‍රියත්වයේ හිනිපෙත්තේ සිටි ස්වකීය ඥාති දියණි ශිරෝමි ප්‍රනාන්දු ඒ සඳහා පුහුණු කරවනු ලැබිය

ගීතය පටිගත කිරීමට සූදානම්ය එහෙත් එහි තනුව සරසවන්නට තවත් යමක් කරන්නට තිබුනේ නම් අපුරුය

ඔහුට අපුරු අදහසක් පහළ විය ඩඩඩඩඩඩඩදේවස්ථානයේ පියතුමා තෙපළන ඒ වදන් වැළ මෙහි ඇතුළත් කළේ නම් ?

ඊට සුදුසුම පුද්ගලයා සොයා ධමර්ත්නයන් පියමං කලේ මරදානටය ටවර් රගහල ට මදක් එපිටින් තිබු පියගැටපෙළක් නැග අතුරු මගකට පිළිපන් ඔහු එහි එවකට වාසය කල ඩෝල්කි වාදකයෙකු හමුවිය ඒ ඩොල්කි වාදකයා ඉස්ලාම් බැතිමතෙකි නමින් පූජා ඉස්මයිල් ය

එවක ජනප්‍රිය වෙළඳ තැටි හා සිනමා ගී පටිගතකිරීම් සඳහා මැදිරියේ ඩොල්කි වාදනයේ යෙදුනු ඔහු ට එදින තමාට සුපුරුදු ඩොල්කි වාදනය වෙනුවට ගීතයක කොටසක් ගායනා කරන්නට සිදුවි තිබිනි

ගීතය ට ඇවැසි අන්තර් වාදනය සරසවන්නට කැඳවුයේ සරත් දසනායකයන් ස්ටැන්ලි පීරිස් ඇතුළු සංගීතවේදින්ගේ පටිගත කිරීම් ප්‍රියතමයා වු ක්ලෝඩ් ප්‍රනාන්දුය

ඔහු එදා මේ සඳහා වැයු යමහා (YAMAHA YC 45) එවකට ශ්‍රී ලංකාවේ තිබුනු තාක්ෂණයෙන් වඩාත් පරිපූර්ණ ඕගන් මාදිලියයි එහි හිමිකරුවාණෝ ප්‍රවිණ පොප් ශිල්පිනි මරියසෙල් ගුණතිලකයන්ගේ පියාණන් වූ රාජා මහතාය

---

*පාදක සටහන*

*එවකටද ලාංකීය කිතුණු දේව මෙහෙයන් පැවැත්වුයේ ලතින් බසිනි*

*ඉහත මාතෘකා කෙරුණු මෙම ගීතයේ ආරම්භක ගායන පාඨය දේව මෙහෙයන් පැවැත්වීමේදී තෙපළන ලතින් ආශිර්වදනකි එහි අර්ථය සාමය වේවා යන්නය*

*( විශේෂ ස්තුතිය * ප්‍රවිණ සංගීතඥ ගායක මෙල්රෝයි ධර්මරත්න මහතා වෙත)*

http://geemuthumala.blogspot.com.au/